# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2012.11.29 |
| **වේලාව** | : | පෙ.ව. 09.30 |

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රී | අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එම්. එච්. සීලවතී මිය |

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

සභා රැස්වීම් වාර්තාව සම්බන්ධව විවේචන සහ අදහස් දැක්වීම් නොවූ බැවින් එය කියවූ ලෙස සලකා මහා සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම පවත්වන්නට යෙදෙන්නේ 2012 වර්ෂයේ නොවැම්බර් මාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී. එමෙන්ම මෙම සභා වාරයන් සම්මත සභා රීතීන්ට අනුව සිදු කිරීම අවශ්‍ය කටයුත්තක් බවත්, එබැවින් ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලා සහ සභාවේ නිලධාරීන් සඳහා සභා කටයුතු විධිමත්ව සිදු කිරීම සම්බන්ධ වැඩමුළුවක් ද පැවැත්වූ බව දන්වන ලදී. එමෙන්ම, පළාත් පාලන ආයතන අතර සමස්ත ලංකා කාර්ය සාධන තරගයේ දී කිහිපවරක්ම දෙවන ස්ථානය දිනා ගැනීමට මෙම සභාව සමත් වූවත්, පළමු ස්ථානය ලබා ගැනීමට නොහැකි වූයේ මහා සභා රැස්වීම් සභා රීතීන්ට අනුකුලව නොපැවැත්වීම හේතුවෙන් බව ද, ඉදිරියේ දී එම තත්ත්වය මගහරවා ගැනීමට හැකි වන බව ද එතුමා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

එමෙන්ම මෙවර මහා සභා රැස්වීම් වාරයේ දී 2013 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව ද සඳහන් කළේය.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් සභාව අමතමින්, මෙම සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය

බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලය, ගබඩාව, පෙර පාසැල්, ආයුර්වේදය, ක්‍රීඩාගාරය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය, විදුණැන පියස, සම්පත් පියස, ලේකම් නිල නිවස, වැව්වත්ත හා ඕලුගංතොට ප්‍රජාශාලා, මහජන පුස්තකාලය හා තානායම යන අංශයන් සඳහා 2012 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සඳහා වන සමීක්ෂණ මණ්ඩලය ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

1. සභාපති ප්‍රධාන කළමනාකරණ සහකාර එස්. එච් අමිතා කරුණාරත්න මිය
2. සාමාජික කළමනාකරණ සහකාර, පී. මංගලිකා දමයන්ති මිය
3. සාමාජික කළමනාකරණ සහකාර එම්. සෙල්වරාණි මිය
4. සාමාජික කළමනාකරණ සහකාර, ප්‍රීතිකා දිල්හානි උක්වත්ත මෙනෙවිය
5. සාමාජික කළමනාකරණ සහකාර, මධුෂානි මැදගම මෙනෙවිය

එමෙන්ම මහජන පුස්තකාලයේ පොත් සමීක්ෂණය සඳහා පුස්තකාලයාධිපති එස්. පී. වික්‍රමරත්න මෙනෙවිය සහ එහි කාර්ය මණ්ඩලය සහභාගී කරවීමට සුදුසු බව ද යෝජනා කරන ලදී

තව ද, තානායමේ භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට පහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩලය සහභාගී කරවීම සුදුසු බව ද යෝජනා කරන ලදී.

1. සාමාජික කළමනාකරණසහකාර මංගලිකා දමයන්ති මිය
2. සාමාජික කළමනාකරණ සහකාර එම්. සෙල්වරාණි මිය
3. සාමාජික කාර්යාල කාර්ය සහායක එම්. ජී. ප්‍රේමදාස මයා
4. සාමාජික තානායම් කළමනාකරු ළහිරු වීරසිංහ මයා

එමෙන්ම භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ධර්මසේන සමරසිංහ සහ එම්. ටී. එම්. රූමි යන ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා සුදුසු බවට ද යෝජනා කරන ලදී.

මෙම යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් හෝ යෝජනා ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය

**06:02 නගර සභාව සතු වාහන 2013 වර්ෂයට රක්ෂණය කිරීම**

2013 වර්ෂයේ බළන්ගොඩ නගර සභාවට අයත් වාහන සහ ගරු මන්ත්‍රීතුමන්ලාගේ යතුරුපැදි රක්ෂණය කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 බළන්ගොඩ ධීවර සංස්ථා වෙළඳසැල ආරම්භ කිරීම සම්බන්ධ ලිපිය**

බළන්ගොඩ නගරයේ ලංකා ධීවර සංස්ථා වෙළඳ සැලක් සී/ස බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියට අයත් බළන්ගොඩ කෙළින් වීදියේ අංක 262 නොහොත් වර්තමාන වරිපනම් අංක 83 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල තුළ කඩ කාමරයක් බදු පදනම මත ලබා ගෙන විවෘත කිරීම සඳහා අදාල බලපත්‍රය නිකුත් කරන ලෙස ඉල්ලා ලංකා ධීවර සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ විසින් යොමු කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර අදාල අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් අනුව රජයෙන් බොහෝ මුදල් ප්‍රමාණයක් වියදම් කර මෙම වෙළඳසැල ඉදිකර තිබෙන හෙයින් මේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දිය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වන ලද අතර, මෙම සභාවේ කටයුතු නගර සභා ආඥාපනතට අනුකූලවම සිදු කරන හෙයින් වෙළඳපොල සීමාවෙන් බැහැර එවන් වෙළඳසැලක් පවත්වාගෙන යාමට අනුමැතිය ලබා දීමට නොහැකි බව ගරු සභාපතිතුමන් විසින් එම ඉල්ලීමට පිළිතුරු වශයෙන් පැහැදිලි කරදෙන ලදී.

මෙම අදහස් සලකා බැලීමෙන් අනතුරුව නගර සභා ආඥා පනතට අනුව පොදු වෙළඳසැල සීමාවේ පමණක් මාළු වෙළඳසැල් පවත්වාගෙන යාම කළ හැකි බැවින් එම ඉල්ලීමට අනුමැතිය ලබා නොදීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:04 බළන්ගොඩ නගර සභාවේ 2011 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

බළන්ගොඩ නගර සභාවේ 2011 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. එමෙන්ම සතුටුදායක අන්දමේ විගණන මතයක් ලබා ගැනීමට හැකිවීම මෙම සභාව ලද ජයග්‍රහණයක් වන බවට ප්‍රකාශ කරන ලද ගරු සභාපතිතුමා, එය ලබා ගැනීමට දායක වූ මෙම සභාවේ ගණකාධිකාරී මහතා ඇතුළු ගිණුම් අංශයේ නිලධාරී මහත්ම මහත්මීන්ගේ පෞද්ගලික ලිපිගොණු වලට ප්‍රශංසා සහතික ඇතුලත් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 සභාවට අයත් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සේවා ගිවිසුම අලුත් කිරීම**

මෙම සභාවට අයත් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සේවා ගිවිසුම 2013.01.01 සිට 2013.12.31 දින දක්වා කාල සීමාව සඳහා අළුත් කර ගැනීමට ගෙවිය යුතු රු. 10,510.00ක මුදල සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 ඩී 17 දරන කඩ කාමරය**

බස්නැවතුම්පොලේ ඇති ඩී 17 දරන කඩකාමරය කුලී පදනම මත අවශ්‍ය අයකුට ලබා දීමට ද, එසේ ලබා ගත් අය විසින් හිඟ කඩකුලී ගෙවා එම කඩකාමරයේ දොර ඔහුගේ වියදමින් සකස් කර ගැනීමට කොන්දේසියක් වශයෙන් ඉදිරිපත් කළ යුතු බවට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධ අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 2013 වර්ෂය සඳහා කඩකුලී සංශෝධනය කිරීම**

පොදු වෙළඳසැල කඩ, සාප්පු කඩ හා විවෘත කඩ කාමර සඳහා 2013 වර්ෂය සඳහා කඩකුලී 10%කින් සංශෝධනය කිරීම සඳහා ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, පළාත් පාලන චක්‍රලේඛ 2009/1හි 1.5 ඡේදය පරිදි අවශ්‍යතාවය අනුව වාර්ෂිකව කඩ කුලී සංශෝධනය කළ හැකි බැවින් ඒ අනුව කඩකුලී වැඩි කිරීම මහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

පහත දැක්වෙන රු. 10,000.00ට වැඩි ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

| පොදු ගිණුම | | | | |
|---|---|---|---|---|
| දිනය | විස්තරය | වවුචර අංකය | චෙක් අංකය | මුදල |
| 2012/10/12 | **සභාපති - තුඹගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය**<br>(ගොරොක්ගහමඩ කිරිමණ්ඩල මාවතේ කොටසක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් ගෙවීම) | 15 | 351409 | 18,750.00 |
| 2012/10/12 | **කසුන් ගල් කැටයම්**<br>බොම්බුව ප්‍රජා ශාලාව විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් සමරු ඵලකය සැකසීම සඳහා ගෙවීම | 16 | 351411 | 21,000.00 |
| 2012/10/15 | **ජී. ඩබ්. ඉන්ද්‍රලාල් මයා**<br>කර්මාන්තය සඳහා ගංගා වැලි කියුබ් 05ක් ලබා ගැනීම | 40 | 351436 | 34,000.00 |
| 2012/10/19 | **සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය**<br>කිරිඳිගල කළුඇල්ලෙ කැලේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා ගෙවීම් කිරීම | 43 | 351443 | 98,039.22 |
| 2012/10/19 | **සභාපති - තුඹගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය**<br>රිෂානා සර්විස් අසලින් ඇති ඉහල මාර්ගයේ බැම්ම බැඳ කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ගෙවීම | 44 | 351442 | 98,039.22 |

| | | | | |
|---|---|---|---|---|
| 2012/10/23 | **සාමාන්‍යාධිකාරී - ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2012.09.20 සිට 2012.09.30 දින දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 50 | 351459 | 104,499.20 |
| 2012/10/23 | **සාමාන්‍යාධිකාරී - ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2012.09.15 වන දින සිට 2012.09.17 වන දින දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 51 | 351459 | 51,558.20 |
| 2012/10/23 | **සාමාන්‍යාධිකාරී - ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2012.08.02 වන දින සිට 2012.08.29 වන දින දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 52 | 351459 | 77,714.40 |
| 2012/10/30 | **ලංකා විදුලිබල මණ්ඩලය**<br>2012 සැප්තැම්බර් මස විදුලි බිල්පත පියවීම<br>කාර්යාලය - රු. 23,859.38<br>යාබද ගොඩනැගිල්ල - රු. 386.25 | 55 | 351478 | 24,245.63 |
| 2012/10/30 | **ලංකා විදුලිබල මණ්ඩලය**<br>2012 සැප්තැම්බර් මස විදුලි බිල්පත් පියවීම<br>කාර්යාලය - රු. 13,664.00 | 59 | 351474 | 13,664.00 |
| 2012/10/30 | **ජේ. ජී. පී. වික්‍රමසිංහ මයා**<br>2012 සැප්තැම්බර් මස පුවත්පත් සැපයීම වෙනුවෙන් ගෙවීම | 61 | 351468 | 21,290.00 |
| 2012/10/30 | **ලංකා ටෙලිකොම් ලිමිටඩ්**<br>නාගරික මන්ත්‍රී දුරකථන බිල්<br><br>ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා<br>- රු. 4,713.59<br><br>ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා<br>- රු. 3,106.40<br><br>එම්. ජේ. මලික් ෂා මැතිතුමා<br>- රු. 3,491.22 | 62 | 351484 | 11,311.21 |
| 2012/10/30 | **ළහිරු අබේසිංහ මයා**<br>කාර්ය සාධන තරගය වෙනුවෙන් කාර්යාලයේ තොරතුරු දැක්වෙන පුවරු සැකසීම | 66 | 351487 | 13,200.00 |
| 2012/10/30 | **නිම්න එන්ටර්ප්‍රයිසස්**<br>බෝම්බුව ප්‍රජාශාලාවේ ඉදිකිරීම් වෙනුවෙන් ද්‍රව්‍ය මිල දී ගැනීම | 58 | 351488 | 24,285.00 |
| 2012/10/30 | **යශෝධා හාඩ්වෙයාර්**<br>බෝම්බුව ප්‍රජාශාලාව අළුතින් කාමරයක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ෂීට් ලබා ගැනීම | 70 | 361490 | 12,075.00 |
| 2012/11/01 | **බී. ගුණරත්න මයා**<br>2012.10.16 සිට 2012.10.31 දක්වා නගරයේ කසළ එකතු කිරීම හා ප්‍රවාහනය | 01 | 351493 | 114,791.67 |

| | | | | |
|---|---|---|---|---|
| 2012/11/02 | **සාමාන්‍යාධිකාරී - ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය** 2012.09.02 සිට 2012.09.21 දින දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 02 | 351493 | 117,308.80 |
| 2012/11/05 | **ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්** | 11 | 355851 | 17,120.99 |
| 2012/11/07 | **ජී. ඩබ්. ඉන්ද්‍රලාල්** කර්මාන්ත අංශය සඳහා ගංගා වැලි සැපයීම | 17 | 355856 | 40,800.00 |
| 2012/11/08 | **සභාපති - සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය** පුරණගෙදර මාර්ගය සංවර්ධනය කිරීම | 21 | 355864 | 18,566.49 |
| 2012/11/12 | **හර්ෂන කලර් සෙන්ටර්** කර්මාන්ත අංශය සඳහා තීන්ත ලබා ගැනීම | 25 | 355867 | 48745.92 |
| 2012/11/14 | **ජාතික ජල සම්පාදන මණ්ඩල** 2012 ඔක්තෝබර් මස ජල බිල්පත පියවීම | 37 | 355871 | 20,248.48 |
| 2012/11/14 | **පී. එම්. සේනාරත්න මයා** බෝම්බුව ප්‍රජාශාලාව විදුලි සැපයුම ලබා දිම සඳහා අවශ්‍ය විදුලි උපාංග මිල දී ගැනීම | 40 | 355889 | 40,008.00 |
| 2012/11/14 | **දේශානි එන්ටර්ප්‍රයිසස්** බෝම්බුව ප්‍රජාශාලාව සඳහා අවශ්‍ය දොර ලොක් 04ක් මිලට ගැනීම | 41 | 355884 | 11,800.00 |
| 2012/11/14 | **නිම්න එන්ටර්ප්‍රයිසස්** බෝම්බුව ප්‍රජාශාලාව සඳහා අවශ්‍ය බට වර්ග සහ උපාංග මිල දී ගැනීම | 43 | 355886 | 48,896.00 |
| 2012/11/14 | **අරුණ ගිෆ්ට් සෙන්ටර්** කාර්යසාධන තරගය වෙනුවෙන් කාර්යාලයේ බාහිර පෙනුම අලංකාර කිරීම සඳහා පින්තූර සහ ද්‍රව්‍ය ලබා ගැනීම | 44 | 355887 | 12,180.00 |
| 2012/11/14 | **එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම** 2012.01.01 වන දින සිට 2012.12.31 වන දින දක්වා නගරයේ කසළ එකතු කිරීම, ප්‍රවාහනය හා බස්නැවතුම්පොල සහ මහජනපොල පොදු වැසිකිළිය පිරිසිදුකිරීම, නඩත්තුව සඳහා ලංසු කැඳවීම වෙනුවෙන් ගෙවීම. | 45 | 355888 | 34,944.00 |
| 2012/11/14 | **සාමාන්‍යාධිකාරී - ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය** 2012.09.05 සිට 2012.09.14 දින දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 46 | 355890 | 85,441.20 |
| 2012/11/14 | **සාමාන්‍යාධිකාරී ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය** 2012.09.02 සිට 2012.09.25 දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 47 | 355890 | 116,104.20 |
| 2012/11/14 | **එම්. ජී. පියසේන** 2012.10.11 මිට 2012.11.08 වන දින දක්වා පෞද්ගලික බස් ගාල් ගාස්තු සඳහා කොමිස් මුදල් ආපසු ගෙවීම | 51 | 355894 | 21,000.00 |

| ලංකා බැංකු ගිණුම | | | | |
|---|---|---|---|---|
| 2012/10/12 | **අරුණ ශාන්ත මයා**<br>කාර්යාල ගොඩනැගිල්ල හා කාර්යාලය පිටුපස තාප්පයේ තීන්ත ආලේප කිරීම වෙනුවෙන් ගෙවීම | 04 | 000214 | 150,360.00 |
| 2012/10/17 | **ලංකා විදුලිබල මණ්ඩලය**<br>2012 සැප්තැම්බර් මස විදුලි බිල්පත පියවීම - බස් නැවතුම්පොල | 05 | 000215 | 61,935.00 |
| 2012/10/17 | **ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය**<br>නව බස් නැවතුම්පොල - රු. 105,100.30<br>පොදු වෙළඳසැල - රු. 11,183.20<br>මහජන පොල - රු. 12,301.30 | 12 | 000222 | 128,584.80 |
| 2012/10/17 | **බී. ගුණරත්න මයා**<br>2012.10.01 - 2012.10.15 දක්වා කසළ එකතු කිරීම හා ප්‍රවාහනය සඳහා ගෙවීම | 13 | 000223 | 114,791.67 |
| 2012/10/17 | **එම්. ජී. පියසේන මයා**<br>2012.09.14 - 2012.10.08 දක්වා කාලය තුළ එකතු කරන ලද පෞද්ගලික බස් ගාල් ගාස්තු කොමිස් ආපසු ගැනීම | 14 | 000224 | 21,000.00 |
| 2012/10/30 | **සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය**<br>කිරිඳිගල කටුඇල්ල කැලේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම කර්මාන්තයේ කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් ගෙවීම. | 15 | 000225 | 61,275.00 |
| 2012/10/30 | **සභාපති, තුඹගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය**<br>රිෂානා සර්විස් අසලින් ඇති ඉහල මාර්ගයේ බැම්ම බැඳ කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ කොන්ත්‍රාත් ගිවිසුම් ඇප ගෙවීම | 16 | 000227 | 61,275.00 |
| 2012/11/07 | **අජිත් දයානන්ද මයා** | 12 | 000229 | 13,600.00 |
| 2012/11/07 | **නිම්න එන්ටර්ප්‍රයිසස්** | 03 | 000230 | 22,375.00 |
| 2012/11/07 | **හර්ෂණ කලර් සෙන්ටර්** | 04 | 000231 | 31,362.24 |
| 2012/11/17 | **ලංකා විදුලිබල මණ්ඩලය** | 05 | 000232 | 83,640.00 |
| 2012/11/19 | **බී. ගුණරත්න මයා**<br>කසළ එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම | 06 | 000233 | 114,791.00 |
| 2012/11/20 | **සාමාන්‍යාධිකාරී - ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2012.10.10 සිට 2012.10.25 වන දින දක්වා ඉන්ධන බිල්පත් ගාස්තු | 07 | 000234 | 104,144.40 |
| 2012/11/20 | **සාමාන්‍යාධිකාරී - ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2012.10.05 සිට 2012.10.15 වන දින දක්වා ඉන්ධන බිල්පත් ගාස්තු | 08 | 000234 | 105,714.00 |

| තානායම ගිණුම | | | | |
|---|---|---|---|---|
| 2012/10/17 | **<u>යූ. එන්. මාකටින්</u>**<br>බියර් ලබා ගැනීම | 39 | 292681 | 37,025.16 |
| 2012/10/18 | **<u>හර්ෂන කලර් සෙන්ටර්</u>**<br>තානායම දෙමහල් ගොඩනැගිල්ල සඳහා තීන්ත ලබා ගැනීම | 42 | 292683 | 35,424.96 |
| 2012/10/18 | **<u>කේ. ඒ. අයි. නිශාන්ත</u>**<br>තානායම විදුලි උපකරණ ලබා ගැනීම | 43 | 292684 | 13,280.00 |
| 2012/10/19 | **<u>ප්‍රියන්ත මුතුමාල මයා</u>**<br>මාලු ලබා ගැනීම | 44 | 292685 | 60,887.00 |
| 2012/10/30 | **<u>ඊ. එම්. ජී. කරුණාරත්න ඔෆ්සෙට්</u>**<br>රිසිට් පොත් මුද්‍රණය කිරීම | 46 | 292687 | 45,500.00 |
| 2012/10/30 | **<u>කේ. එම්. අයි. නිශාන්ත මයා</u>**<br>විදුලි උපාංග ලබා ගැනීම | 47 | 292688 | 32,680.00 |
| 2012/10/30 | **<u>හර්ෂන කලර් සෙන්ටර්</u>**<br>තානායම දෙමහල් ගොඩනැගිල්ල සඳහා තීන්ත ලබා ගැනීම | 48 | 292689 | 33,050.88 |
| 2012/10/31 | **<u>ළහිරු ශාමල්</u>**<br>තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ දී අතින් වියදම් කළ මුදල් | 49 | 292690 | 20,100.00 |
| 2012/10/31 | **<u>ළහිරු ශාමල්</u>** | 50 | 292690 | 14,000.00 |
| 2012/10/31 | **<u>ජගත් එන්ටර්ප්‍රයිසස්</u>**<br>ගෑස් ලබා ගැනීම | 51 | 292691 | 11,811.00 |
| 2012/10/31 | **<u>එන්. අයි. ටී. ෆාම් ෂොප්</u>**<br>කුකුළු මස් ලබා ගැනීම | 52 | 292692 | 26,550.00 |
| 2012/10/31 | **<u>ලයන් බෲවරි</u>**<br>රටබීම ලබා ගැනීම | 53 | 292693 | 11,593.68 |
| 2012/10/31 | **<u>ලංකා විදුලිබල මණ්ඩලය</u>**<br>2012 සැප්තැම්බර් මස විදුලි බිල්පත | 55 | 292695 | 45,976.32 |
| 2012/10/31 | **<u>ශ්‍රී ස්ටෝර්ස්</u>**<br>මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම | 60 | 292698 | 20,872.00 |
| 2012/10/31 | **<u>ශ්‍රී ස්ටෝර්ස්</u>**<br>මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම | 61 | 292698 | 21,355.00 |
| 2012/10/31 | **<u>ශ්‍රී ස්ටෝර්ස්</u>**<br>මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම | 62 | 292698 | 13,229.00 |
| 2012/10/31 | **<u>සෙනාල් මාකටිං</u>**<br>මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 65 | 293201 | 48050 |

| | | | | |
|---|---|---|---|---|
| 2012/11/02 | **එන්. අයි. ටී. ෆාම් ෂොප්**<br>කුකුළු මස් ලබා ගැනීම | 02 | 293205 | 37,575.00 |
| 2012/11/05 | **සීගිරි ප්‍රින්ටර්ස්**<br>තානායම කෑම සඳහා බිල්පත් මුද්‍රණය කිරීම | 04 | 293208 | 49,375.00 |
| 2012/11/06 | **ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී**<br>රට බීම ලබා ගැනීම | 05 | 293209 | 163,000.00 |
| 2012/11/06 | **ජගත් එන්ටර්ප්‍රයිසස්**<br>ගෑස් ලබා ගැනීම | 06 | 293212 | 14,099.00 |
| 2012/11/07 | **ඉන්දික එරික් සිසිල් මයා**<br>තානායම සඳහා එළවලු ලබා ගැනීම | 08 | 293213 | 11,755.00 |
| 2012/11/07 | **ඉන්දික එරික් සිසිල් මයා**<br>තානායම සඳහා එළවලු ලබා ගැනීම | 12 | 293213 | 14,480.00 |
| 2012/11/07 | **එන්. අයි. ටී. ෆාම් ෂොප්**<br>මාළු ලබා ගැනීම | 13 | 293210 | 24,750.00 |
| 2012/11/14 | **ලංකා විදුලිබල මණ්ඩලය**<br>ඔක්තෝබර් මස විදුලි බිල්පත පියවීම | 15 | 293216 | 41,607.18 |
| 2012/11/14 | **ප්‍රියන්ත මුතුමාල මයා**<br>මාළු ලබා ගැනීම | 16 | 293217 | 50,489.00 |
| 2012/11/14 | **රොක්ලන්ඩ් ඩිස්ට්‍රිබියුටර්ස්**<br>රට බීම ලබා ගැනීම | 19 | 293220 | 11,989.99 |
| 2012/11/14 | **එන්. අයි. ටී. ෆාම් ෂොප්**<br>කුකුළු මස් ලබා ගැනීම | 24 | 293224 | 26,550.00 |
| 2012/11/14 | **රොක්ලන්ඩ් ඩිස්ට්‍රිබියුටර්ස්**<br>රට බීම ලබා ගැනීම | 25 | 293220 | 83,787.96 |

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 08:01 උඩ ඇල්ලෙපොල, බුළුගහයට මාර්ගයේ ඉතිරි කොටස පඩි යොදා සංවර්ධනය කිරීම

උඩ ඇල්ලෙපොල, බුළුගහයට මාර්ගයේ ඉතිරි කොටස පඩි යොදා සංවර්ධනය කිරීම කර්මාන්තය සඳහා වන වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

### 09:01 මස් කඩ ටෙන්ඩරය නැවත ඉදිරිපත් කිරීම

මේ සඳහා මහා සභාව කාරක සභා අවස්ථාවකට පත් කිරීම සුදුසු යැයි ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ සඳහා විරුද්ධ අදහස් ඉදිරිපත් නොවූ බැවින් ලංසු විවෘත කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

පොදු වෙළඳසැල අංක 15, 16, 17 යන කඩ කාමර සඳහා එක් අයදුම්පත බැගින් ලැබී තිබුණු අතර, මෙම සභාව විසින් දක්වන ලද අවම මිල ගණන් වලට වඩා වැඩියෙන් හා මෙම සභාව විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි වලට එකඟව එම අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ හෙයින් ඒවා පිළිගැනීමට ලංසු මණ්ඩලය වශයෙන් ක්‍රියාකරන ලද මෙම සභාවේ ගරු සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සහ ලේකම්තුමිය තීරණය කරන ලදී.

මෙවරත් ලංසු ඉදිරිපත් කර තිබූනේ 2012 වර්ෂයේ ලංසුව ලබාගත් අයදුම්කරුවන්ම වන අතර, 2012 වර්ෂයට අදාල ලංසු ඇප තැන්පත් මුදල්ම මෙම වර්ෂයට අදාල ලංසු තැන්පත් වශයෙන් හිලව් කර ගන්නා මෙන් ඉල්ලා ඔවුන් විසින් ලංසු මණ්ඩලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එම ඉල්ලීම පිළිගැනීමට ලංසු මණ්ඩලය තීරණය කරන ලදී.

**09:02 ND 5124 වෑන් රථය අළුත්වැඩියා කිරීම**

නගර සභාව සතු ND 5124 වෑන් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලක්මිණි මෝටර්ස් ආයතනයෙන් අදාල සේවාව ලබා ගැනීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී. ඒ අනුව අදාල අලුත්වැඩියාව සඳහා වැය වන මුදල රු. 165,000.00කි.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න:

නැත

## 11. යෝජනා

**11:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

**1. කොම්පෝස්ට් අලෙවි ජාලය ශක්තිමත් කිරීම**

මා විසින් පිළිසරු ව්‍යාපෘතියට ඉදිරිපත් කරන ලද දෙවන ව්‍යාපෘති වාර්තාව අනුමත වීමෙන් මිලියන 4.2ක් වටිනා මෙට්‍රික් ටොන් 7.5ක් පැටවිය හැකි ලොරියක් මෙම සභාවට ලැබෙන බවට දන්වා ඇත. එය ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය සමග එළැඹි ගිවිසුම අනුව පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව මෙයින් යෝජනා කරමි.

1. ලබා දෙන ලොරිය කොම්පෝස්ට් හා නොදිරන අපද්‍රව්‍ය සම්බන්ධව ස්ටිකර් මගින් අලංකාර කිරීම.
2. මෙම අලෙවි ජාලය ක්‍රියාත්මක කිරීම පිණිස අලෙවිකරණය පිළිබඳ දන්නා බර වාහන රියදුරු බලපත්‍ර හිමි අයෙකු පූර්ණ කාලීනව සේවයට ගැනීම.
3. එම පුද්ගලයාට මසකට රු. 20,000.00ක රියදුරු දීමනාවක් සමඟ අලෙවි කරනු ලබන පොහොර ප්‍රමාණය මත 10%ක කොමිස් මුදලක් ලබා දීම.
4. සතියකට දින 06ක් අලෙවිකරණයේ යෙදීම.
5. එසේම පොහොර අලෙවිකර පැමිණෙන විට දිරා නොයන අපද්‍රව්‍ය ලෙස ගැනෙන පොලිතින්/ප්ලාස්ටික්/වීදුරු කටු හා යකඩ ප්‍රමාණවත්ව මිල දී ගෙන රැගෙන ඒම.
6. අදාල පුද්ගලයාට එම ද්‍රව්‍ය මිල දී ගැනීමට රු. 10,000.00ක අත්තිකාරම් මුදලක් ලබා දීම.

**2. ආපදා සඳහා සූදානම් වීම සහ ගෝලීය උණුසුම අවම කිරීමේ ව්‍යාපෘතිය**

බළන්ගොඩ නගර සභාව විසින් ආපදා සඳහා පූර්ව සූදානම් වීම සහ ගෝලීය උණුසුම පාලනය කිරීම සඳහා UN Habitat ආයතනය සහ UN ISDR ආයතනයන් සමග එක්ව විශේෂ ව්‍යාපෘතියක් මේ වන විට ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා පහත සඳහන් යෝජනාව අනුමැතියට ඉදිරිපත් කරමි.

1. මෙම ව්‍යාපෘතිය යටතේ කර ඇති සැලසුමට රු. මිලියන 16ක වියදමක් අපේක්ෂා කරන අතර, UN Habitat ආයතනයෙන් රු. මිලියන 8ක් ලැබෙන අතර ඉතිරි මුදල වෙනත් ආයතනයකින් සොයා ගැනීමට අපේක්ෂා කරමි.
2. එම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම සඳහා දැනට මෙම සභාවේ පිහිටුවා ඇති ආපදා අවම කිරීම් සහ දේශගුණික විපර්යාස අවම කිරීමේ ඒකකය සඳහා ඉංග්‍රිසි භාෂාවෙන් කටයුතු කිරීමේ හැකියාව සහිත, මනා පරිගණක දැනුමක් හා ප්‍රජාව සමග කටයුතු කිරීමේ හැකියාවක් සහිත අයෙකු රු. 20,000.00ක දීමනාවක් යටතේ තත්කාර්ය පදනම යටතේ බඳවා ගැනීමට යෝජනා කරමි.
3. එසේම එළැඹෙන වර්ෂයේ ඉදිරිපත් කරන නව අයවැය මගින් ආපදා සඳහා සූදානම් වීම සහ ගෝලීය උණුසුම පාලනය කිරීමේ කාර්යයන් සඳහා නිශ්චිත වැය ශීර්ෂයක් මගින් අයවැයෙන් නිෂ්චිත (රු. 500,000) මුදලක් වෙන් කිරීමට යෝජනා කරමි.
4. එසේම නාගරික මන්ත්‍රීවරුන්ගෙන්, නිලධාරීන් සහ නගර වාසීන්ගෙන් සමන්විත ස්ථාවර කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.
5. 2013 ජනවාරි මාසයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ස්විට්සර්ලන්තයේ දී පැවැත්වීමට නියමිතව තිබෙන සසකාවා ජාත්‍යන්තර සම්මානය සඳහා ඉදිරිපත් වීම.
6. දැනට සැලසුම් සකස් කර ඇති දොරවෙල ඔය සංරක්ෂණ ව්‍යාපෘතියේ පළමුවැනි අදියර යටතේ රු. මිලියන 08කින් ඉදිකිරීමට නියමිත කොටස ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කිරීමට අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලමි.

ඉහත යෝජනාවන් ගරු ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් එම යෝජනාවන් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

1. බළන්ගොඩ නගර සභාව සතු ඉඩමක නවීන තාක්ෂණයට අනුව ගව ඝාතකාගාරයක් ඉදිකරවා එමගින් නගර සභාවට ආදායමක් ලබා ගැනීමට කටයුතු කිරීම.
2. බළන්ගොඩ බස් නැවතුම්පොලෙහි මගීන් වැඩිපුර ගැවසෙන තවත් ස්ථාන දෙකක පැන්තාලි ඉදිකිරීම හා අපහසුතා ඇති මගීන්ට දුෂ්කරතාවය මගහරවා ගැනීම සඳහා ගිමන් හැරීමට සිමෙන්ති බදාමයෙන් ආසන කිහිපයක් ඉදිකිරීම.

ඉහත යෝජනාවන් ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් දැක්වීම් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2012 සැප්තැම්බර් ලැබීම් විග්‍රහය

- 2012 සැප්තැම්බර් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය සභාවේ අනුමත විය**.**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 6,093,387.85 |
| වෙනත් ලැබීම් | 1,128,803.64 |
| **මුළු ලැබීම්** | **7,222,191.49** |
| පුනරාවර්තන වියදම් | 5,083,918.65 |
| වෙනත් වියදම් | 718,816.44 |
| මුළු වියදම් | **5,802,735.09** |

- බළන්ගොඩ තානායමේ 2012.10.01 සිට 2012.10.31 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවේ අනුමත විය.

### 12:02 2012.09.01 සිට 2012:09.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව

2012.09.01 සිට 2012:09.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 626,761.60කි

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:03 2012.10.01 සිට 2012:10.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව

2012.10.01 සිට 2012:10.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 635,838.35කි.

## 13. 2013 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීම

2013 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර එයට සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එහි සංශෝධන කිසිවක් නොවූ හෙයින් මහා සභාවේ ඒකච්ඡන්දයෙන් සම්මත විය.

## 14. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 08:01 පුස්තකාල උපදේශක කමිටු වාර්තාව

2012.11.08 දිනැති පුස්තකාල උපදේශන කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 15. වෙනත් කරුණු:

### 13:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා:

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා සභාව අමතමින් බලන්ගොඩ නගර සභාවේ ඉඩමක ගව ඝාතනාගාරයක් ආරම්භ කිරීමෙන් නගර සභාවට වැඩි ආදායමක් ලබා ගැනීමට සහ පාරිභෝගිකයන් හට හොඳ තත්ත්වයේ මස් සැපයීමට හැකි බව ද, ගවයින් ඝාතනය කිරීමට පෙර අවශ්‍ය අයට දැක බලා ගැනීමට හැකියාව ලැබීමෙන් නීති විරෝධී ගව ඝාතන සිදු නොවීමට කටයුතු කළ හැකි බව ද දක්වන ලදී.

එමෙන්ම බලන්ගොඩ නගරයේ බස් නැවතුම්පොල අසල පැන්තාලියක් ඉදිකිරීමෙන් මගී ජනතාවට සහ පාසැල් සිසුන්ට බොහෝ සහනයක් වන බවද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

### 13:02 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා:

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා සභාව අමතමින්, ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද නවීන තාක්ෂණයට අනුව ගව ඝාතනාගාරයක් ඉදිකිරීම සම්බන්ධ යෝජනාව ඉතා සුදුසු කාලෝචිත යෝජනාවක් බව ප්‍රකාශ කළේය.

එමෙන්ම තමන් විසින් මහා සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ඉදිරපත් කරන ලද යෝජනාවන් ඇතුළත් නොකිරීමට විරෝධය දැක්වීමක් වශයෙන් කලු පටි පැළඳ පැමිණි බව ද සඳහන් කරන ලදී.

### 13:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

පසුගිය කාලයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් නිවාස හානියට පත් වූ දිළිඳු පුද්ගලයන් වෙනුවෙන්, එම නිවාස යථා තත්ත්වයට පත් කර ගැනීමට රු. 5,000.00ක ආධාර මුදලක් ලබා දීමට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී. එම යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එමෙන්ම තමන් මෙතෙක් සහභාගී වූ නගර සභාවේ අයවැය ඉදිරිපත් කිරීමේ අවස්ථාවන්ට වඩා අද දිනයේ අයවැය ඉදිරපත් කිරීමේ ස්වභාවය ඉතාමත් ගුණාත්මක බවකින් යුතු බව ද, ඉදිරි අයවැය ප්‍රකාශන වලින් නගර වාසීන්ට තව තවත් සහන ලැබේ නම් වැදගත් බව ද, ප්‍රකාශ කරන ලදී.

### 13:04 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා

අධික වර්ෂාව හේතුවෙන් බලන්ගොඩ, කරදියමුල්ල මාර්ගය අබලන් තත්ත්වයට පත්ව ඇති බව ද, ඒ හේතුවෙන් එම මාර්ගයේ ධාවනය වූ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සහ පෞද්ගලික අංශයට අයත් බස් රථයන් දෙක දැන් සති දෙකක් තිස්සේ ධාවනය නොවීමෙන් ප්‍රදේශවාසී ජනතාව සහ විශේෂයෙන් පාසැල් සිසුන් මහත් අපහසුතාවයකට පත්ව සිටින බව ද ප්‍රකාශ කළේය. මෙය පළාත් සභා මාර්ගයක් බැවින් ජනතාවට ඇතිවන අපහසුතාව සම්බන්ධයෙන් පළාත් සභාව දැනුවත් කිරීම කළ යුතු බව ද එහි කාණු පද්ධතිය සකස් කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව ද ප්‍රකාශ කළේය.

### 13:05 ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා

වර්ෂා කාලයේ දී පමණක් ඩෙංගු මර්ධනය සඳහා කටයුතු කිරීම ප්‍රමාණවත් නොවන බව ද, වර්ෂා කාලය පැමිණිමට පෙර සිටම ඒ සඳහා සූදානම් වීමේ අවශ්‍යතාවයක් ඇති බව ද ප්‍රකාශ කරන ලදී.

**13:06 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා සභාව අමතමින්, පෙර දින පැවති අධික වර්ෂාව හේතුවෙන් තම අසල්වැසියන් දෙදෙනෙකුගේ නිවාසයන් ද හානියට පත්ව ඇති බැවින්, උප සභාපතිතුමාගේ යෝජනාවේ දී සම්මත වූ පරිදි එම දෙදෙනා හට ද අදාල නිවාස නැවත ගොඩනගා ගැනීම සඳහා වන ආධාර මුදල ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

**13:07 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා සභාව අමතමින්, තමන්ගේ දේශපාලන දිවිය තුළ පවත්වන ලද ඉතාමත් සාර්ථක මහා සභා රැස්වීම අද දිනයේ පැවැත්වීමට හැකි වූ බවත්, ඒ සම්බන්ධව සතුටට පත් වන බවත් ප්‍රකාශ කරන ලදී. සම්මත සභා රීතීන්ට අනුකූලව මහා සභාව පැවැත්වීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ කැපවීම පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණයක් වශයෙන් සභාවට ඉදිරිපත් කිරීමට සුදුසු තත්ත්වයේ නොතිබූ යෝජනාවන් න්‍යාය පත්‍රයට ඉදිරිපත් නොකළ බව ද, ඒ හේතුවෙන් ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කිරීමට මෙය අවස්ථාවක් කර ගත් බව ද, තමන් විසින් සිදු කරන ලද එම පරීක්ෂණයෙන්ද සියළුම මන්ත්‍රීතුමන්ලා සමත්ව ඇති බව ද වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. දැන් මෙම නගර සභාව සභා රීතීන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බව ද එතුමා විසින් වැඩිදුරටත් දක්වන ලදී.

එමෙන්ම පුවත් වාර්තාකරණය සම්බන්ධයෙන් ජනමාධ්‍යවේදීන්ගේ දායකත්වය මහත් සේ අගය කරන බව ද ප්‍රකාශ කරන ලදී. ජනමාධ්‍යයන්හි පළකරන පුවත් සම්බන්ධයෙන් දේශපාලඥයන් කේන්ති ගැනීම නොකළ යුතු බව ද, දේශපාලකයන් වශයෙන් තමාගෙන් සිදුවන අතපසුවීම් නිවැරදි කර ගැනීමට මාධ්‍යවේදීන්ගේ දායකත්වය අත්‍යවශ්‍යවන බව ද ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමන් විසින් පළාත් පාලන ආයතනයන්හි ප්‍රගතිය පිණිස ප්‍රශංසනීය සේවාවක් සිදු කරන ලද බව ද, අධ්‍යාපනය අතින් ලංකාවේ තෙවන තැනට සබරගමුව පළාත ගෙන ඒමට එතුමන් පසුගිය ධූර කාලයේ දී ක්‍රියා කරන ලද බව ද, ඒ ආකාරයෙන්ම දැනට පිරිහීමට ලක්ව ඇති සබරගමු පළාත් සෞඛ්‍ය සේවය ද ඉහල මට්ටමකට ගෙන ඒමට එතුමන් ක්‍රියා කරනු ඇති බව ද ප්‍රකාශ කරන ලදී.

අද දින ඉදිරිපත් කරන ලද අයවැය වාර්තාව මෙතෙක් තමන් විසින් ඉදිරිපත් කරන ලද සාර්ථකම අයවැය වාර්තාව බව ප්‍රකාශ කළේය. ඒ සඳහා මෙම සභාවේ ගණකාධිකාරී මහතා වෙත ස්තුතිය හිමි විය යුතු බව ද ප්‍රකාශ කරන ලදී. මෙම අයවැය වාර්තාව සකස් කරන ලද්දේ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගේ සහ නගරවාසී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමෙන් පසුව බව ද, එබැවින් අයවැය වාර්තාවට කිසිවකුගේ විරෝධයක් ඇති වීමට හේතුවක් නොමැති බව ද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

## 14. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

අද දින සභා වාරයේ වැඩකටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ට සිය ස්තුතිය පල කරමින් මහා සභාවේ කටයුතු ප.ව. 5.00ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.